# පෙරහුරු ප්‍රශ්න පත්‍රය - අංක 05

**පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2022**

EXAMINATION GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES - 2022

## II පත්‍රය

**පැය 01 මිනිත්තු 15**

**විභාග අංකය : ..................................................**

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :**

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.** (සමහර ප්‍රශ්නවල අනු කොටස් දී ඇත.)
- පිළිතුරු **තුනක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- පිළිතුරු ලියන්නට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට ඉරක් පමණක් අඳින්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි අවසාන ලකුණ නිවැරදි ය. | V/II/S/CH |


**නිර්මාණය : නීතිඥ ශ්‍රේෂන් කුලරත්න, හිටපු අධ්‍යක්ෂ**
(මුල් ළමාවිය සංවර්ධන සහ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම)
0714-500044

**01. පහත සඳහන් ඡේදය හොඳින් කියවන්න.**

අප රිංගු ගඟ අද්දර කැලේ එක පැත්තක අහස අල්ලන්නට මෙන් ඉහළ නගින්නේ කඳු ගැටයක් නිසා ය. ඒ කඳු ගැටය මුදුනේ දූවැන්ත කළු ගලක් ඇත. එය අපේ ගම දෙස බලා සිටින අද්භූත මිනිසකු වැන්න. කුඩා කල මේ ගල් පර්වතය අප සිත බියෙන් තැති ගැන්වී ය. හැන්දෑවට මේ ගල මුදුනට මලානික අව් රැල්ලක් වැටෙයි. එය රාස්සිගේ අව්ව යැයි වැඩිහිටියෝ කීහ.

- **ඡේදය ඇසුරෙන් පමණක් පිළිතුරු සපයන්න.**

(i) කඳු ගැටය මුදුනේ තිබෙනුයේ කුමක් ද?

.......................................................................................................................................

(ii) මෙහි සඳහන් උපමාවක් ලියන්න.

.......................................................................................................................................

(iii) මලානික අව් රැල්ලක් වැටෙන්නේ කුමන ස්ථානයකට ද?

.......................................................................................................................................

(iv) ඡේදයේ සඳහන් ප්‍රථම පුරුෂ බහුවචන උක්ත පදයක් ලියන්න.

.......................................................................................................................................

(v) පහළ යන අදහසට විරුද්ධාර්ථ පදය ඡේදයෙන් සොයා ලියන්න.......................................

(vi) ඡේදයේ සඳහන් විශේෂණ පදයක් තෝරා ලියන්න. .............................................................

**02. නිවැරදි ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.**

(i) දිය පහර වේගයෙන් පහළට ...................... ගලයි / ගලති.

(ii) ගායිකාව මිහිරි ලෙස ගීතයක් .................... ගැයුවේ ය / ගැයුවා ය.

(iii) ඔවුහු පාරේ දකුණු පසින් ගමන් ............... කළේ ය / කළහ.

**03. ගැළපෙන විරාම ලකුණු යොදන්න.**

මොනවා ද ඒවායේ නම්

**04. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.**

(i) නිරන්තරයෙන් / වෙනුවෙන් / ආරක්ෂාව / දරුවන්ගේ / ඇය / වෙහෙසුණා ය

.......................................................................................................................................

(ii) කරා / තම / ආවෝ ය / හවසට / කුරුල්ලෝ / කැදලි

.......................................................................................................................................

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිළිණයකි. NSB

[තුන්වැනි පිටුව බලන්න.]

**05. මෙම වැකි ලේඛන වහරට හරවා ලියන්න.**

(i) ගොවියෝ කුඹුරු කොටනවා. ..........................................................................................

(ii) නංගී පාසල් ගියා ..........................................................................................

**06. පහත සඳහන් ප්‍රස්ථාව පිරුළේ හිස්තැනට ගැළපෙන කොටස තෝරාගෙන යටින් ඉරක් අඳින්න.**

ඉඟුරු දීලා ...................................... (මිරිස් / හාල්) ගත්තා වගේ.

**07. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය යටින් ඉරක් අඳින්න.**

(i) ප්‍රශ්න / ප්‍රශ්ණ (ii) පළල / පලළ

**08. පහත සඳහන් කවියේ හිස්තැනට අදාළ කවි පදය සම්පූර්ණ කරන්න.**

ඇසී නාද හඬ බඹරුන්ගේ ලීලා
පැසී ගොයම් පත් කිරට නැමීලා
ගැසී සුළං වාතෙට ඉති නැමීලා
.........................................................................

**09. පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.**

(i) තෑගි ..................................... (ii) සිරිත් .....................................

**10. පහත සඳහන් තේරවිල්ල තෝරා ලියන්න.**

ගසක නොපිපෙන මල ..........................................................................................

**11. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.**

 .....................................

 .....................................

**12. පහත සඳහන් එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය බැගින් ලියන්න.**

(i) **Yellow** ..................................... (ii) **Parrot** .....................................

**13. පහත සඳහන් වාක්‍යය ඉංග්‍රීසි භාෂාවෙන් කියන ආකාරය ඉංග්‍රීසි අකුරුවලින් ලියන්න.**

කරුණාකර මට සමාවෙන්න. ..........................................................................................

**14. "තංගෙ" යන දෙමළ වචනයේ අර්ථය සිංහලෙන් ලියන්න.** ..........................................................................


**15. මෙම වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.**

පොළ කොහේ ද ? ..........................................................................................

**16. හතලිස් හය දහස් අනූනවය සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.** ..........................................................................

**ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිළිණයකි. NSB**


**විභාග අංකය :** ....................................................

**17.** 


(i) රවුම තුළ ඇති ඉලක්කම් සියල්ල යොදා ගනිමින් සෑදිය හැකි විශාලම සංඛ්‍යාව ලියන්න. ..........................................


(ii) පහත සඳහන් සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට සකස් කළ පසු මැද සංඛ්‍යාව කුමක් ද? 1407, 89, 1010, 2975, 820 ............................................................

**18.** පහත සඳහන් අඹ ගොඩෙහි තිබෙන මුළු අඹ ගෙඩි සංඛ්‍යාව රෝම සංඛ්‍යාවෙන් ලියන්න.




............................................


**19.** පහත සඳහන් ලී පටි දෙකෙහි මුළු දිග කොපමණ ද? ..........................................




**20.** (i) මෙම රූපයේ අඳුරු කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. ......................

(ii) අඳුරු කර නොමැති කොටස භාගයක් ලෙස ලියන්න. ................



**21.** 


මෙම රූපයේ සමමිතික රේඛා කොපමණ තිබේ ද?

..........................................

**22.** මතුගම බස් නැවතුමෙන් පෙ.ව. 7.30 ට ගමන් ආරම්භ කළ බස් රථයක් ප.ව. 2.45 ට අනුරාධපුරයට ළඟා විය.

(i) මෙම බස් රථය අනුරාධපුරයට ළඟා වීමට ගත කළ කාලය කොපමණ ද?.............................................

(ii) අනුරාධපුරයට ළඟා වූ වේලාව පැය විසි හතර ඔරලෝසු වේලාවෙන් ලියන්න. ..................................

**23.** 


මෙම රූපයේ සමචතුරස්‍ර කීයක් දක්නට ලැබේ ද?

.....................................

**24.** පහත රූපයේ දැක්වෙන සිලින්ඩරයේ

(i) මුහුණත් ගණන කීය ද? ....................................

(ii) වක්‍ර දාර කීය ද? ....................................



**25.** පහත සඳහන් සංඛ්‍යා රටාවල හිස්තැනට සුදුසු සංඛ්‍යාව ලියන්න.

(i) 15, 22, 29, ........, 43, 50 (ii) 14, 18, 22, ........, 30, 34

**26.** අභ්‍යාස පොත් 263 ක්, එක් සිසුවෙකුට පොත් 6 බැගින් සමසේ බෙදා දුන්නේ නම්,

(i) බෙදා දෙන ලද සිසුන් සංඛ්‍යාව කොපමණ ද? ...........................................................................

(ii) සමසේ බෙදා දුන් පසු ඉතිරි වන පොත් සංඛ්‍යාව කොපමණ ද? ................................................

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිළිණයකි. NSB

[පස්වැනි පිටුව බලන්න.]

27. සිසුවෙකු විසින් පලතුරු වෙළඳ සැලකින් පහත සඳහන් පලතුරු මිලදී ගන්නා ලදී.
- ඇපල් ගෙඩියක් රුපියල් 40.00 බැගින් ඇපල් ගෙඩි 3 ක්
- අඹ ගෙඩියක් රුපියල් 50.00 බැගින් අඹ ගෙඩි 3 ක්

(i) මෙම පලතුරු සඳහා ගිය වියදම කොපමණ ද? ..............................................................................................


(ii) වෙළෙන්දාට රුපියල් 500 ක් දුන්නේ නම් සිසුවාට ලැබෙන ඉතිරි මුදල කොපමණ ද?

.......................................

28. ලීටර 22 මිලිලීටර 500 ක් විශාල ටැංකියක දැනට තිබෙන ජලය ප්‍රමාණය ලීටර 4 මිලිලීටර 750 කි. එම ටැංකිය සම්පූර්ණයෙන් ජලයෙන් පිරවීම සඳහා දැමිය යුතු ජලය ප්‍රමාණය කොපමණ ද?

..................................................

29. පහත සඳහන් වන්නේ එක්තරා කුකුළු ගොවිපලකින් දින 5 කදී ලබාගත් බිත්තර ප්‍රමාණය ඇතුළත් වගු සටහනක් හා ප්‍රස්තාර සටහනකි. එය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




| සතියේ දිනයන් | බිත්තර සංඛ්‍යාව |
|---|---|
| සඳුදා | ....... |
| අඟහරුවාදා | 25 |
| බදාදා | 20 |
| බ්‍රහස්පතින්දා | 30 |
| සිකුරාදා | 10 |
| එකතුව | 105 |

(i) සතිය තුළ ලැබූ මුළු බිත්තර සංඛ්‍යාවෙන් 1/3 ක් ම ලබා ගත් දින දෙක කුමක් ද? ..............................

(ii) බ්‍රහස්පතින්දා ලබා ගත් බිත්තර ප්‍රමාණය ප්‍රස්ථාරයේ ඇඳ ලකුණු කරන්න.

(iii) සඳුදා ලබාගත් බිත්තර ප්‍රමාණය වගුවේ ලියන්න.

■ අංක **30** සිට **59** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.

30. කාලයක් ගතවී මල් පිපෙන ශාකයක් වන්නේ මින් කුමක් ද?

(1) කඩුපුල් (2) රෝස (3) වතුසුද්ද

31. පසට විෂ සහිත කසල ද්‍රව්‍යයකි.

(1) පොල්කටු (2) පොලිතීන් (3) රෙදි කැබලි

32. පහත සඳහන් පිළිතුරු අතරින් ජාතික ගීය ගායනා කරන විට දී සිටිය යුතු වැරදි ඉරියව්ව දැක්වෙන කරුණ කුමක් ද?

(1) හිස සෘජුව තබාගෙන ඉදිරිය බලා සිටීම.

(2) ශරීරය සෘජුව තබා ගෙන පහසුවෙන් සිටීම.

(3) දෙඅත් සෘජුව පහළට දිග හැර සියළු ඇඟිලි නවා මිට මොළවා සිටීම.

33. ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය වන්නේ මින් කුමක් ද?

(1) බෝ ගස (2) නා ගස (3) කොස් ගස

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිළිණයකි. NSB
[හයවැනි පිටුව බලන්න.]

**34. කටු සහිත ශාකයකි.**

(1) නිදිකුම්බා (2) ඉඟුරු (3) කහ

**35. සිසුවෙකු විසින් එක්තරා පරීක්ෂණයක් සඳහා තණකොළ ටිකක් පොල් කට්ටකින් වසා දින කිහිපයකට පසු නැවත විවෘත කරන ලදී. ඒ පරීක්ෂණය අනුව ඔහුට පෙනී ගිය කරුණ කුමක් ද?**

(1) පැළයක් සෑදීමට හිරු එළිය අවශ්‍ය බව ය.

(2) පැළයක් සෑදීමට ජලය අවශ්‍ය බව ය.

(3) පැළයක් සෑදීමට ඉඩකඩක් අවශ්‍ය බව ය.

**36. හීන් දිගටි පත්‍ර සහිත ශාකයකි.**

(1) සියඹලා (2) උණ (3) කොට්ටම්බා

**37. සර්ව භක්ෂක සතෙකි.**

(1) වඳුරා (2) එළුවා (3) කුකුළා

**38. කැලි කසල දිරාපත් කරවමින් පරිසරයට උදව් කරන සතෙකි.**

(1) කපුටා (2) ඇටිකුකුළා (3) වේයා

**39. සතුන්ගේ පැවැත්මට හිතකර ක්‍රියාවකි.**

(1) කුරුල්ලන් සඳහා කෑම ලෑල්ලක් සැකසීම

(2) පොළොව කෙටීම

(3) කැළෑ එළිපෙහෙළි කිරීම

**40. අතීතයේ දී දුම් ගැසීමෙන් කල්තබා ගන්නා ලද ආහාර වර්ගයක් වන්නේ මින් කුමක් ද?**

(1) කුරුඳු (2) බිලිං (3) කරවල

**41. නියමිත වේලාවට ආහාර නොගැනීමෙන් වැළදෙන රෝගයකි**

(1) දියවැඩියාව (2) අම්ල පිත්ත රෝගය (3) අධික රුධිර පීඩනය

**42. ගෙවත්තක් පවත්වාගෙන යෑමේ වාසි අතරට අදාළ නොවන කරුණ කුමක් ද?**

(1) පිරිසිදු ආහාර ප්‍රයෝජනයට ගත හැකි වීම

(2) නිවසේ අලංකරණයට හානි වීම

(3) වස විෂ රහිත ආහාර පරිභෝජනයට ලැබීම.

**43. කොම්පෝස්ට් පොහොර බඳුනකට නොදැමිය යුතු කසල වර්ගය වන්නේ මින් කුමක් ද?**

(1) අළු (2) ඉවත් කරන ආහාර කොටස් (3) රෙදි කැබලි

**44. අත් ලේන්සුවක් භාවිතයේ දී ක්‍රියා කළ යුතු අයුරු දැක්වෙන කරුණුවලට අදාළ නොවන පිළිතුර කුමක් ද?**

(1) කිවිසුම් යන විට නාසය හා මුව වැසීම

(2) අවශ්‍ය අවස්ථාවලදී තම ආසනය හා මේසයේ දූවිලි පිසදා ගැනීම.

(3) අවශ්‍ය විට මුව පිස දැමීම හා අත් පිස දැමීම


ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිළිණයකි. NSB

[හත්වැනි පිටුව බලන්න.]

**45.** **සිසුවෙකු විසින් පස් සාම්පලයක් බෝතලයකට දමා පසුව එයට ජලය ස්වල්පයක් දමා හොඳින් සොලවා නිශ්චලව තබන ලදී. ඒ අනුව ඔහුට එම ද්‍රාවණයේ ඉහලින්ම දක්නට ලැබෙනුයේ කුමක් ද?**

(1) ශාක හා සත්ව කොටස් (2) වැලි (3) ඉතා සියුම් වැලි

**46.** **පහත රූපයෙන් දැක්වෙන්නේ සිසුවෙකු සිදු කරන ලද එක්තරා පරීක්ෂණයකි. මෙම පරීක්ෂණයෙන් ඔහු සොයා ගනු ලැබුවේ කුමක් ද?**




(1) හිරු එළියේ බලපෑම මත ලුණු නිපදවීම
(2) හිරු එළිය මගින් ජලය රත්කර ගැනීම.
(3) හිරු එළියේ වර්ණ හඳුනා ගැනීම

**47.** **ශ්‍රව්‍ය දෘෂ්‍ය සන්නිවේදන මාධ්‍යයකි.**

(1) වේදිකාව (2) පෝස්ටර (3) ගුවන් විදුලිය

**48.** 

**රූපයේ දැක්වෙන දේශීය සංගීත භාණ්ඩය කුමක් ද?**

(1) තාලම්පට
(2) බුම්මැඩිය
(3) උඩැක්කිය

**49.** **මූලික වර්ණ තුන ඇතුළත් පිළිතුර තෝරන්න.**

(1) කහ, නිල්, කළු (2) රතු, කහ, නිල් (3) දම්, නිල්, කහ

**50.** **කලා වැව නිර්මාණය කළ රජතුමා වන්නේ කවරෙකු ද?**

(1) මහසෙන් රජු (2) ධාතුසේන රජු (3) දේවානම්පියතිස්ස රජු

**51.** **වොලිබෝල් ක්‍රීඩාව සඳහා එක පිළකට සිටිය යුතු ක්‍රීඩකයින් සංඛ්‍යාව කොපමණ ද?**

(1) 5 (2) 6 (3) 7

**52.** **දියේ ගිලෙන්නට යන අයෙකු බේරාගැනීම සඳහා ජලයට විසිකර ඔහුට අල්ලා ගැනීමට දිය යුතු ද්‍රව්‍යයක් නොවන්නේ මින් කුමක් ද?**

(1) ටයරයක් (2) දිග ලණුවක් හෝ රෙද්දක් (3) ලැල්ලක්

**53.** **කතුරක් වැනි උල් ආයුධයක් යම් තැනැත්තෙකුට ලබාදීමේ දී දිය යුතු ක්‍රමය දැක්වෙන පිළිතුර තෝරන්න.**

(1) ලබාදෙන්නා කතුරෙහි මුල පැත්ත අල්ලා තුඩ පැත්ත ලබා ගන්නාට දීම.
(2) කතුරෙහි තුඩ පැත්ත ලබාදෙන්නා අල්ලා මුල පැත්ත ලබාගන්නාට අල්ලා ගැනීමට දීම.
(3) ලබාගන්නාගේ අත්ල මත තැබීම.

**54.** **වැදි ජනතාව අතර ප්‍රචලිත නැටුම් විශේෂයකි.**

(1) කිරි කොරහ නැටුම (2) කඩු නැටුම (3) කාවඩි නැටුම

**55.** 

**රූපයේ සඳහන් මාර්ග සංඥාවෙන් අදහස් කරනුයේ කුමක් ද?**

(1) පදිකයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි.

(2) ළමයින් මාරුවන ස්ථානය.

(3) ළමයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි.

**56.** **පොදු වාහනයක ගමන් කරන මගියෙකු විසින් පවත්වා ගත යුතු යහපත් පුරුදු අතරට අදාළ නොවන පිළිතුර තෝරන්න.**

(1) අනවශ්‍ය ද්‍රව්‍ය වීදුරුවෙන් එළියට විසි කිරීම

(2) පා පුවරුවේ ගමන් නොකිරීම

(3) බස් රථයට හෝ  අදාළ පොදු වාහනයට පෝළිමේ සිට නැගීම.

**57.** **යම් අයෙකුට විදුලි සැර වැදුණු විටක ප්‍රථමයෙන් ම සිදු කළ යුතු කාර්යය කුමක් ද?**

(1) විදුලි සැර වැදුණු තැනැත්තා අල්ලා ඉවත් කිරීම

(2) වැඩිහිටි ආධාර ඉල්ලා කෑ ගැසීම

(3) වියලි ලී දණ්ඩකින් අදාළ තැනැත්තා ඉවත් කිරීම

**58.** **මදුරුවන් මගින් බෝවන රෝගයකි**

(1) ජලභීතිකාව (2) ඩෙංගු (3) පාචනය

**59.** **ජල ෆිල්ටරයක පතුලට ම දැමිය යුතු ද්‍රව්‍යයක් වන්නේ මින් කුමක් ද?**

(1) තිරුවානා ගල් (2) අඟුරු (3) පුලුන්

**60.** **ගස් වැල් සහිත පරිසරයක ජීවත්වීමට ලැබීම වාසනාවන්ත ය. පරිසරයට සිසිලස ලබා දෙමින් පරිසරය සුවඳවත් කරමින් සුළඟට අපූරු රටා මවමින් , ගස්වැල් පරිසරය සුන්දර කරයි. මේ පිළිබඳ සිහි-පත් කරමින් "ගස්වැල් පරිසරය සුන්දර කරයි" යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට වඩා වැඩිවිය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය, අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)**

(i) ..............................................................................................................

..............................................................................................................

(ii) ..............................................................................................................

..............................................................................................................

(iii) ..............................................................................................................

..............................................................................................................

## පෙරහුරු ප්‍රශ්න පත්‍රය - අංක 5
## II පත්‍රය - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ලකුණු |
|---|---|---|
| 01. | (i) දැවන්ත කළු ගලක් | 1 |
| | (ii) අපේ ගම දෙස බලා සිටින අද්භූත මිනිසකු වැන්න | 1 |
| | (iii) මේ ගල මුදුනට | 1 |
| | (iv) වැඩිහිටියෝ | 1 |
| | (v) ඉහළ | 1 |
| | (vi) දැවැන්ත / අද්භූත /ගඟ අද්දර | 1 |
| 02. | (i) ගලයි (ii) ගැයුවා ය. (iii) කළහ. | 3 |
| 03. | ”මොනවා ද ඒවායේ නම්?” | 1 |
| 04. | (i) ඇය දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් නිරන්තරයෙන් වෙහෙසුණා ය. | 1 |
| | (ii) සවසට කුරුල්ලෝ තම කැදලි කරා ආවෝ ය. | 1 |
| 05. | (i) ගොවියෝ කුඹුරු කොටති. | 1 |
| | (ii) නංගී පාසල් ගියා ය. | 1 |
| 06. | මිරිස් | 1 |
| 07. | (i) ප්‍රශ්න (ii) පළල | 2 |
| 08. | පැසී ගොයම් කෙත සුරපුර ලීලා | 1 |
| 09. | (i) බෝග (ii) විරිත් | 2 |
| 10. | බිම්මල | 1 |
| 11. | (i) Bicycle (ii) Frock | 2 |
| 12. | (i) කහ (ii) ගිරවා | 2 |
| 13. | Please excuse me. | 1 |
| 14. | නංගී | 1 |
| 15. | සන්දෙ එංගේ | 1 |
| 16. | 46099 | 2 |
| 17. | (i) 7210 | 2 |
| | (ii) 1010 | 1 |
| 18. | viii | 2 |
| 19. | 12 cm | 2 |
| 20. | (i) 0.3 (ii) 7/10 | 2 |
| 21. | 4 | 2 |
| 22. | (i) පැය 7 යි මිනිත්තු 15 | 2 |
| | (ii) පැය 14 : 45 | 2 |
| 23. | 9 | 2 |
| 24. | (i) 2 (ii) 2 | 2 |
| 25. | (i) 36 (ii) 26 | 2 |
| 26. | (i) 43 | 2 |
| | (ii) 5 | 1 |
| 27. | (i) රුපියල් 270.00 | 2 |
| | (ii) රුපියල් 230.00 | 1 |
| 28. | ලීටර 17 මිලිලීටර 50 | 2 |
| 29. | (i) අඟහරුවාදා සහ සිකුරාදා (ii) 20 | 2 |
| | (iii) නිවැරදි ප්‍රමාණයට ඇඳ ලකුණ කර තිබිය යුතුය. | 1 |

| ප්‍රශ්න අංකය | පිළිතුරු |
|---|---|
| 30. | 1 |
| 31. | 2 |
| 32. | 2 |
| 33. | 2 |
| 34. | 1 |
| 35. | 1 |
| 36. | 2 |
| 37. | 3 |
| 38. | 3 |
| 39. | 1 |
| 40. | 3 |
| 41. | 2 |
| 42. | 2 |
| 43. | 3 |
| 44. | 2 |
| 45. | 1 |
| 46. | 3 |
| 47. | 1 |
| 48. | 1 |
| 49. | 2 |
| 50. | 2 |
| 51. | 2 |
| 52. | 1 |
| 53. | 2 |
| 54. | 1 |
| 55. | 3 |
| 56. | 1 |
| 57. | 3 |
| 58. | 2 |
| 59. | 3 |

(ලකුණු 1 x 30)

60) දෙන ලද උපදෙස් අනුව නිවැරදි වාක්‍ය තුනක් ලියා තිබිය යුතුයි. (ලකුණු 6 යි)

**සමස්ත පිළිතුරු පත්‍රයේම අත් අකුරු සහ ඉලක්කම් සලකා බලා අතිරේක ලකුණු 02 ක් ප්‍රදානය කරන්න.**

**මුළු ලකුණු 100**